කොවිඩ්-19 වාර්තාකරණය සම්බන්ධයෙන් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය මගින් නිකුත් කොට ඇති නිර්දේශයන්හි , 'වෛරසය ආසාදිත පුද්ගලයින් "රෝගීන්" මිස අනෙක් අයට "රෝගය පතුරුවන්නන්" ලෙසින් හැඳින්වීමෙන් වලකින' ලෙසින් සඳහන් වේ. මෙම නිර්දේශය පිළිපදින ලෙසින් මාධ්‍ය දිරිමත් කිරීමේ අරමුණ වන්නේ, කොවිඩ්-19 ආසාදිතයන් සම්බන්ධයෙන් සමාජය තුළ කොන් කිරීමේ ආකල්පයක් සහා සමාජ ගර්හාවක් ඇතිවීමට තිබෙන හැකියාව අවම කිරීම සහ ඒ ඔස්සේ රෝගීන් නිසි වෛද්‍ය උපදෙස් හා ප්‍රතිකාර නොගෙන සැඟවීමට ඇති ඉඩ අවම කිරීමයි.

2020 ඔක්තෝබර් 01 සිට ඔක්තෝබර් 23 දක්වා කාලය තුළ තෝරාගත් සිංහල භාෂා පුවත්පත් නිරීක්ෂණය කිරීම මගින් සොයාගත්, ඉහත කී මාධ්‍ය ආචාර ධර්ම නිර්දේශය විවිධ පුවත්පත් මගින් කඩ කොට ඇති වාර ගණන පහත දත්ත සටහන ඔස්සේ දැක්වේ.

මෙවැනි ආචාර ධාර්මික නොවන ආකාරයෙන් කොවිඩ්-19 පිළිබඳ පුවත් වාර්තා කිරීම ඔස්සේ සිදුවන්නේ කොවිඩ්-19 ආසාදිතයන් සහ නිරෝධායනයට ලක් කරන්නන් සමාජයේ කොන් කිරීමකට ලක් වීමත්, එය කොවිඩ්-19 මර්දන කටයුතු වෙතද බලපෑම් එල්ල කිරීමත් බවත් මාධ්‍ය වෙත සිහිපත් කිරීමට මෙය අවස්ථාව කර ගනිමු. එනිසා, කොවිඩ්-19 වසංගතය මර්දනයට සමාජයම උත්සුක වෙමින් පවතින මේ මොහොතේ ආචාර ධාර්මික මාධ්‍යකරණයක යෙදීමේ අවශ්‍යතාවයද නැවතත් අවධාරණය කරමු.

මූලාශ්‍ර: https://mcusercontent.com/.../6a771830-d3bd-456e-8fbf...

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #NewsPapers #Divaina #SundayDivaina #Mawbima #SundayMawbima #Lankadeepa #SundayLankadeepa #Dinamina #Silumina #Aruna #SathiAgaAruna**